# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2025

**10 ශ්‍රේණිය**

## තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

**නම / විභාග අංකය : ..............................................** **කාලය පැය 1 යි.**

## 1 පත්‍රය

සැලකිය යුතුය.

- ✶ සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ✶ අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 01, 02, 03, හා 04 යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් සුදුසු පිළිතුර තෝරාගන්න.

---

01. දත්ත සහ තොරතුරු පිළිබඳ පහත ප්‍රකාශ සළකා බලන්න.

A. සැකසීම සඳහා භාවිතා කරන දේ තොරතුරු ලෙස හඳුන්වනු ලැබේග

B. කාලය ගත වීමත් සමඟ තොරතුරුවල වටිනාකම අඩුවේ.

C. තීරණ ගැනීමේ දී සැකසූ දත්ත වැදගත් වේ.

D. කාර්යක්ෂමබව ගුණාත්මක තොරතුරක ලක්ෂණයක් නොවේ.

නිවැරදි පිළිතුරු අඩංගු වරණය තෝරන්න.

1) A, B හා C පමණි.
2) B,C හා D පමණි.
3) B හා C පමණි.
4) A,B,C හා D

02. තොරතුරු පද්ධතියක් සම්බන්ධයෙන් වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.

1) තොරතුරු ආදානය, දත්ත ප්‍රතිදානය හා සැකසීම
2) දත්ත රැස් කිරීම, සැකසීම හා ඒවා තොරතුරු බවට පත් කිරීම
3) දත්ත ආදානය, සැකසීම හා තොරතුරු ප්‍රතිදානය
4) දත්ත ආදානය, තොරතුරු ප්‍රතිදානය හා වර්ගීකරණය

03. විද්‍යුත් රාජ්‍ය සේවාවක් වන G2C භාවිතා වන අවස්ථාවක් සඳහා උදාහරණයක් නොවන්නේ,

1) මාර්ගගතව විදුලි බිල්පත් ගෙවීම
2) ශ්‍රී ලංකා සිතියම බාගත කර ගැනීම
3) වෙබ් අඩවිය ඔස්සේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ලබා ගැනීම
4) චක්‍රලේඛ හා ගැසට් බාගත කර ගැනීම

04. ඉගෙනුම් කළමනාකරණ පද්ධතියක පහසුකමක් නොවන වරණය තෝරන්න.

1) පාසලේ දී ම ඉගෙනුම් ඒකක හා සම්බන්ධ වීමට සිදුවීම.
2) ඉ- තැපැල මගින් දෙමාපියන්ට තොරතුරු යැවීම.
3) වීඩියෝ දර්ශන මගින් විෂය සමගාමී ක්‍රියාකාරකම් හා සම්බන්ධ වීමේ හැකියාව
4) පැවරුම් නිවසේ දී නිම කර එසැනින් උඩුගත කිරීමේ හැකියාව.

05. දුරස්ථ අධ්‍යාපනයේ ගති ලක්ෂණ පිළිබඳ පහත වගන්ති සලකන්න.

A. නම්‍යශීලී කාල රාමුවක් තුළ පහසු ස්ථානයක සිට ඉගෙනීමට ඇති හැකියාව

B. පාඨමාලා ලියාපදිංචියේ දී ලබා දෙන අංකිත පුස්තකාල සේවාව

C. මාර්ගගත පැවරුම් හා ප්‍රශ්නාවලී

D. මාර්ගගත ගුරුවරයකු හා සම්බන්ධ වීමේ පහසුකම

දුරස්ථ අධ්‍යාපනය පිළිබඳ නිවැරදි ප්‍රකාශ පමණක් ඇතුළත් වරණය තෝරන්න.

1) A හා B පමණි.
2) A,C හා D පමණි.
3) B හා D පමණි.
4) ඉහත සියල්ල ම

06. වෛද්‍ය පරීක්ෂණ සඳහා භාවිත කරන තාක්ෂණික උපකරණ අතරින් මොළයේ ක්‍රියාකාරීත්වය සටහන් කිරීම සඳහා යොදා ගැනෙන උපකරණය කුමක් ද?

1) ECG
2) EEG
3) CAT
4) MRI

07. ලොව පළමු වන යාන්ත්‍රික ගණිත කර්ම කරන උපකරණය ඇතුළත් වරණය තෝරන්න.

1) ඇබකසය
2) ආකලන යන්ත්‍රය
3) විශ්ලේෂණ යන්ත්‍රය
4) ස්වයංකරණ අනුක්‍රමීය පාලන ගණක යන්ත්‍රය

08. පහත දී ඇති උපාංග අතුරින් දැක්වීමේ උපාංගයක් **නොවන්නේ** කුමක් ද?

1) මෙහෙයුම් යටිය
2) ආලෝක පෑන
3) ස්පර්ෂක සංවේදී තිරය
4) තීරු කේත කියවනය

09. බස් හා තරු යන ජාල ස්ථලකයන්ගෙන් සමන්විත වන ජාල ස්ථලකය වන්නේ මින් කවරක් ද?

1) මුදු ආකාරය
2) රුක් ආකාරය
3) දැලක ආකාරය
4) සංයුක්ත ආකාරය

10. තොරතුරු තාක්ෂණයේ හානිකර තත්වයක් **නොවන්නේ,**

1) ඇබ්බැහිවීම
2) නුසුදුසු වෙබ් අඩවි වෙත යොමුවීම
3) සමාජ ජාල හරහා මිතුරු ඇසුර
4) ඡායාරූප හා පුද්ගලික තොරතුරු අවභාවිතය

11. 32 GB සඳහා තුල්‍ය **නොවන** අගය කුමක් ද?

1) $2^5$GB
2) $2^{15}$MB
3) $2^{35}$Byte
4) $2^{45}$Bits

12. විද්‍යුත් වාණිජ්‍යයේ අවාසිදායක කරුණ තෝරන්න.

1) එක් තැනක සිට භාණ්ඩ තේරීමේ හා ඇණවුම් කිරීමේ හැකියාව
2) පැය 24 පුරා සේවාව
3) ඇනවුම් කළ භාණ්ඩය හා නොගැළපීම
4) විද්‍යුත් ගෙවීම් ක්‍රමයක් අනුගමනය කළ හැකි වීම

13. චෙක්පතක නිරවද්‍යතාව පරීක්ෂා කිරීම සඳහා භාවිතා වන සුපරීක්ෂක ආකාරය කුමක් ද?

1) පැතලි තල සුපරීක්ෂකය
2) චුම්භක තීන්ත අනුලක්ෂණ කියවනය
3) ප්‍රකාශ අක්ෂර සංජානනය
4) ප්‍රකාශ සළකුණු සංජානනය

14. පහත සඳහන් උපාංග අතරින් ආදාන ප්‍රතිදාන කාර්යයන් දෙකම සඳහා යොදා ගැනෙන උපක්‍රමය කුමක් ද?

1) මූසිකය
2) ස්පර්ෂ සංවේදී තිරය
3) ස්පර්ෂක පෑඩය
4) සුපරීක්ෂකය

15. පහත වර්ගීකරණයන් අතරින් පරිගණක, **තාක්ෂණය අනුව** නිවැරදිව වර්ගීකරණය කර ඇති වරණය තෝරන්න.

1) උකුළු පරිගණක, අත්ල පරිගණක, මේස පරිගණක
2) සුපිරි පරිගණක, මධ්‍ය පරිගණක, මහා පරිගණක
3) සේවා දායක පරිගණක, සේවා ලාභී පරිගණක
4) අංකිත පරිගණක, ප්‍රතිසම පරිගණක, මිශ්‍ර පරිගණක

16. දත්ත පරිවර්තකයෙකු ලෙස ක්‍රියාකරන පරිගණක ජාල සම්බන්ධ කිරීමේ උපක්‍රමය කුමක් ද?

1) මං හසුරුව
3) මොඩමය
2) නාභිය
4) ගිනිපවුර

17. චුම්භක මාධ්‍ය ආචයන උපාංග පමණක් අඩංගු වරණය තෝරන්න.

1) දෘඪ තැටිය, ප්‍රකාශ පෑන, සැනෙළි මතකය
2) නම්‍ය තැටිය, දෘඪ තැටිය, සංයුක්ත තැටිය
3) සංයුක්ත තැටිය, සංඛ්‍යාංක බහුවිධ තැටිය
4) දෘඪ තැටිය, චුම්භක පටිය, නම්‍ය තැටිය

18. $10001010_2$ යන ද්වීමය සංඛ්‍යාවට තුල්‍ය නොවන සංඛ්‍යාව කුමක් ද?

1) $810_8$
3) $8_{16}$
2) $212_8$
4) $138_{10}$

19. $37_{16}$ ෂඩ් දශමය සංඛ්‍යාවට තුල්‍ය අෂ්ටමය සංඛ්‍යාව කුමක් ද?

1) $67_8$
3) $31_8$
2) $37_8$
4) $55_8$

20. දශමය 75 ට තුල්‍ය අගය සහිත පිළිතුර තෝරන්න.

A. $1001011_2$
C. $4B_{16}$
B. $113_8$
D. $4A_{16}$

1) A, B පමණි.
3) A, B හා C පමණි.
2) A, B හා D පමණි.
4* A, B,C හා D සියල්ල ම.

21. දත්ත ප්‍රවේශ කර ගැනීමේ වේගය අනුව පහත උපාංග ආරෝහණ පිළිවෙළින් දැක්වෙන වරණය කුමක් ද?

1) රෙජිස්තර මතකය, නිහිත මතකය, සසම්භාවී පිවිසුම් මතකය, සැනෙළි මතකය
2) සැනෙළි මතකය, සසම්භාවී පිවිසුම් මතකය, නිහිත මතකය, රෙජිස්තර මතකය
3) රෙජිස්තර මතකය, සැනෙළි මතකය, නිහිත මතකය, සසම්භාවී පිවිසුම් මතකය
4) රෙජිස්තර මතකය, සසම්භාවී පිවිසුම් මතකය, නිහිත මතකය, සැනෙළි මතකය

22. මූලික තාර්කික ද්වාර යටතට අයත් නොවන වරණය තෝරන්න.

1) OR ද්වාරය
3) NOT ද්වාරය
2) NOR ද්වාරය
4) AND ද්වාරය

23. දී ඇති පරිපථයේ ප්‍රතිදානය කුමක් ද?




1) A + B’. B’
3) A . A’ + B’
2) A + A’ . B’
4) A . B’ + B’

24. පහත පරිපථයට අදාළ ව ගොඩනගා ඇති සත්‍යතා වගුව P, Q, R, S සඳහා අදාළ නිවැරදි අගයන් ඇතුළත් වරණය කුමක් ද?




| A | B | Z |
|---|---|---|
| 0 | 0 | P |
| 0 | 1 | Q |
| 1 | 0 | R |
| 1 | 1 | S |

1) P=1, Q=0, R=1, S=1
2) P=1, Q=1, R=0, S=1
3) P=1, Q=0, R=1, S=0
4) P=0, Q=0, R=1, S=1

25. ලේඛනයක ස්ථාන කිහිපයක යෙදී ඇති වචනයක් එකවර එම ස්ථාන සියල්ලෙහි ප්‍රතිස්ථාපනය සඳහා භාවිතා කරන කෙටි මං යතුරු සංයෝජනය කුමක් ද?

1) Ctrl + F
2) Ctrl + H
3) Ctrl + A
4) Ctrl + R

26. පහත සඳහන් යෙදුම් මෘදුකාංග අතරින් නිදහස් හා විවෘත කේත වදන් සැකසුම් මෘදුකාංගය කුමක් ද?

1) Microsoft Office Word
2) i work pages
3) Open Office Calc
4) Libre Office Writer

27. බහු මට්ටම් ලැයිස්තු යොදා ගැනීමේ දී එය ආරම්භ කිරීමට භාවිතා කළ යුතු යතුර තෝරන්න.

1) Shift
2) Enter
3) Tab
4) Back Space

28. ලිපි ලේඛන සකස් කිරීමේ දී යොදා ගන්නා වචනයක් වෙනුවට එම අදහස ගෙන දෙන වෙනත් වචනයක් සොයා එම ස්ථානයට යොදා ගැනීම සඳහා වන පහසුකම කුමක් ද?

1) සෙවීම හා ප්‍රතිස්ථාපනය
2) ව්‍යාකරණ හා දෝෂ නිරාකරණය
3) ශබ්ද නිධිය
4) තැපැල් මුසුව

29. දත්ත ආදානය සඳහා යතුරු පුවරුව භාවිතයට පැමිණියේ කුමන පරිගණක පරම්පරාවේ දී ද?

1) පළමු පරම්පරාවේ දී ය.
2) දෙවන පරම්පරාවේ දී ය.
3) තෙවන පරම්පරාවේ දී ය.
4) සිව්වන පරම්පරාවේ දී ය.

30. මධ්‍ය සැකසුම් ඒකක මතකය ලෙස හඳුන්වන මතක ආකාරය කුමක් ද?

1) රෙජිස්තර මතකය
2) නිහිත මතකය
3) සසම්භාවී පිවිසුම් මතකය
4) පඨන මාත්‍ර මතකය

31. පරිගණකයක හෝරා ශීඝ්‍රතාවය (Clock Spead) මනිනු ලබන ඒකකය කුමක් ද?

1) GB
2) GHz
3) Mbps
4) ඉහත කිසිවක් නොවේ.

32. පැතුරුම්පතක, කෝෂයක් තුළ =(3+2)^2/5+3 යන සූත්‍රය ඇතුළත් කළ විට කුමක් ප්‍රතිදානය වේද?

1) 5
2) 8
3) 3.1
4) 10

33. පැතුරුම්පතක, කෝෂ පරාසයක් (B2:D4) ලෙස දී ඇති අවස්ථාවක් සලකන්න. මෙම කෝෂ පරාසය තුළ අඩංගු කෝෂ ගණන කොපමණ ද?

1) 2
2) 8
3) 6
4) 9

34. පැතුරුම්පත් සම්බන්ධයෙන් වඩාත් නිවැරදි වරණය තෝරන්න.

1) සූත්‍ර තීරුවෙහි සූත්‍රයක් දැක ගත හැකි වුව ද ශ්‍රිතයක් දිස් නොවේ.
2) තීරු ශීර්ෂ  අංකවලින් ද පේළි ශීර්ෂ ඉංග්‍රීසි අක්ෂරවලින් ද ලේබල් කර ඇත.
3) සක්‍රීය කෝෂයේ කෝෂ ලිපිනය නාම කොටුව තුළ දිස් වේ.
4) පිරවුම් හැඬලය භාවිතයෙන් පිටපත් කළ හැක්කේ සූත්‍ර හා ශ්‍රිත පමණි.

- පහත සපයා ඇති පැතුරුම්පත් කොටස ඇසුරෙන් පිළිතුරු සපයන්න.

| | A | B |
|---|---|---|
| 1 | 2 | 5 |
| 2 | 4 | 2 |
| 3 | 6 | |
| 4 | | |

35. A3 කෝෂයේ =$A1+A2 සූත්‍රය අඩංගු වේ. එම සූත්‍රය B3 කෝෂයට පිටපත් කළහොත් B3 කෝෂයේ දිස් වන අගය කුමක් ද?

1) 7
2) 4
3) 6
4) 13

36. A3 කෝෂයෙහි වන පිළිතුර ම ලබා තැනීමට යෝග්‍ය ශ්‍රිතය කුමක් ද?

1) =Count(A1:A2)
2) = Total(A1:A2)
3) =Sum(A1+A2)
4) =Sum(A1:A2)

37. 0.035 යන සංඛ්‍යාවේ වැඩිම වෙසෙසි සංඛ්‍යාංකය (MSD) හා අඩුම වෙසෙසි සංඛ්‍යාංකය ( LSD) පිළිවෙළින් දැක්වෙන පිළිතුර කුමක් ද?

1) 5,3
2) 3,5
3) 0,5
4) 3,0

38. පරිගණක තිරය සම්බන්ධ කිරීමට භාවිතා කළ නොහැකි කෙවෙනි ආකාරය කුමක් ද?

1) USB කෙවෙනිය
2) DVI කෙවෙනිය
3) VGA කෙවෙනිය
4) HDMI කෙවෙනිය

39. අන්තර්ජාල වෙබ් අඩවි, පුවත්පත් නිර්මාණය සඳහා බහුලව යොදා ගැනෙන කේත ක්‍රමය සහිත වරණය තෝරන්න.

1) BCD
2) ASCII
3) EBCDIC
4) Unicode

40. වලාකුළු පරිගණක සංකල්පයේ අවාසිදායක තත්වයක් වන්නේ,

1) යෙදුම් මෘදුකාංග පරිගණකයේ ස්ථාපිත නොකර භාවිතයට හැකිවීම.
2) පරිගණක දෘඪ තැටියෙහි ඉඩ ඉතිරි වීම.
3) අන්තර්ජාලය හරහා අපගේ ලේඛන සුරැකීම සඳහා ඉඩ ලබාදීම.
4) වලාකුළු පහසුකම් භාවිතය සඳහා අන්තර්ජාල පහසුකම් අත්‍යවශ්‍ය වීම.